### Vවෙනි ආකෘති පත්‍රය

(29වෙනි වගන්තිය).

අංකය :————.

**මුස්ලිම් විවාහ හා දික්කසාද පනත**
**මුස්ලිම් දික්කසාද ලේකම් පොත**

දිස්ත්‍රික්කය :————.

ක්වාසිගේ ප්‍රදේශය :————.

දික්කසාදය ලියා පදිංචි කරන ක්වාසිගේ සම්පූර්ණ නම :————.

1. ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නම :————.
2. දික්කසාද කරන කාලයේදී ස්වාමිපුරුෂයාගේ පදිංචිය :————.
3. භාර්යාවගේ සම්පූර්ණ නම :————.
4. දික්කසාද කරන කාලයේදී භාර්යාවගේ පදිංචිය :————.
5. විවාහය ලියා පදිංචිකළ පූජකතැනගේ හෝ ලේකම්ගේ සම්පූර්ණ නම, ප්‍රදේශය හා දිස්ත්‍රික්කය :————.
6. විවාහ සටහනේ අංකය සහ දිනය :————.
7. දික්කසාද කළ ස්ථානය :————.


### Vවෙනි ආකෘති පත්‍රය

(29වෙනි වගන්තිය).

අංකය :————.

**මුස්ලිම් විවාහ හා දික්කසාද පනත**
**මුස්ලිම් දික්කසාද ලේකම් පොත**

දිස්ත්‍රික්කය :————.

ක්වාසිගේ ප්‍රදේශය :————.

දික්කසාදය ලියා පදිංචි කරන ක්වාසිගේ සම්පූර්ණ නම :————.

1. ස්වාමිපුරුෂයාගේ සම්පූර්ණ නම :————.
2. දික්කසාද කරන කාලයේදී ස්වාමිපුරුෂයාගේ පදිංචිය :————.
3. භාර්යාවගේ සම්පූර්ණ නම :————.
4. දික්කසාද කරන කාලයේදී භාර්යාවගේ පදිංචිය :————.
5. විවාහය ලියා පදිංචිකළ පූජකතැනගේ හෝ ලේකම්ගේ සම්පූර්ණ නම, ප්‍රදේශය හා දිස්ත්‍රික්කය :————.
6. විවාහ සටහනේ අංකය සහ දිනය :————.
7. දික්කසාද කළ ස්ථානය :————.

8. දික්කසාදයේ අන්දම (එය කරන ලද්දේ සවාමිපුරුෂයා විසින්ද, භායර්‍යාව විසින්ද යන බව) :————.

9. භායර්‍යාව විසින් නම් එය, දෙනලද්දේ ක්වාසි විසින්ද, ක්වාසි මණ්ඩලයේ නොහොත් ශ්‍රෙෂ්ඨාධිකරණයේ ආඥාවක් අනුවද යන්න :————.

10. දික්කසාද කළ දිනය හා වේලාව :————.

11. දික්කසාදය ලියා පදිංචි කළ දිනය :————.

12. අත්සන් :—

(1) පුරුෂයා (පැමිණ සිටියේ නම්) :————.

(2) භායර්‍යාව (පැමිණ සිටියා නම්) :————.

(3) දික්කසාදය ලියා පදිංචි කරන ක්වාසි :————.

---

8. දික්කසාදයේ අන්දම (එය කරන ලද්දේ සවාමිපුරුෂයා විසින්ද, භායර්‍යාව විසින්ද යන බව) :————.

9. භායර්‍යාව විසින් නම් එය, දෙනලද්දේ ක්වාසි විසින්ද, ක්වාසි මණ්ඩලයේ නොහොත් ශ්‍රෙෂ්ඨාධිකරණයේ ආඥාවක් අනුවද යන්න :————.

10. දික්කසාද කළ දිනය හා වේලාව :————.

11. දික්කසාදය ලියා පදිංචි කළ දිනය :————.

12. අත්සන් :—

(1) පුරුෂයා (පැමිණ සිටියේ නම්) :————.

(2) භායර්‍යාව (පැමිණ සිටියා නම්) :————.

(3) දික්කසාදය ලියා පදිංචි කරන ක්වාසි :————.

මුද්දර

## දෙවෙනි උපලේඛනය

## ස්වාමිපුරුෂයකු විසින් දික්කසාදයක් කිරීමේදී අනුගමනය කළයුතු ව්‍යවස්ථා

(27වෙනි සහ 30 වෙනි වගන්ති)

1. සිය භාර්යාව කෙරෙහි 'තලක්' ප්‍රකාශයක් කිරීමට අදහස්කර සිටින්නාවූ ස්වාමිපුරුෂයකු විසින් භාර්යාව පදිංචිව සිටින ප්‍රදේශයෙහි ක්වාසිතැන වෙත තමාගේ අදහස දැන්විය යුතුය. එවිට එකී යුවලගේ ඥාතීන්ගේද, වැඩිහිටියන්ගේද, ප්‍රදේශයෙහි අතිකුත් වැදගත් මුස්ලිම් වරුන්ගේද සහාය ඇතිව ඔවුන් අතර සමාදානයක් පැවැත්වීමට උත්සාහ දැරීම ක්වාසිතැනගේ යුතුකම වන්නේය.

2. 1වෙනි ව්‍යවස්ථාව යටතේ භාර්යාවක් දික්කසාද කිරීම පිණිස පුරුෂයෙකු විසින් දැනුම්දුන් දින සිට තිස්දවසක් ඇතුළතදී ඔවුනතර සමාදානයක් පැවැත්වීම නොහැකිවූ විට, දික්කසාදය පිළිබඳ කටයුතු කරගෙන යාමට ඊට පසුව ද ඔහු කැමතිව සිටී නම්, ඔහු විසින් ක්වාසිතැන සහ සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේදී "තලක්" ප්‍රකාශය කළයුතුය. එවිට ක්වාසිතැන විසින් එකී ප්‍රකාශය වහා සටහන්කොට භාර්යාව පැමිණ නොසිටියා නම්, එම ප්‍රකාශය පිළිබඳ දැන්වීම ඇය වෙත භාරකරවිය යුතුය. ඒ සඳහා අයවියයුතු නියමිත ගාස්තුව ක්වාසිතැන විසින් පුරුෂයාගෙන් මුද්දරවලින් ලබාගත යුතුය. තවද එකී මුද්දර නඩු පොතෙහි අලවා යථා පරිදි ක්වාසිතැන විසින් අවලංගු කළ යුතුය.

3. පුරුෂයාගේ "තලක්" ප්‍රකාශයට හේතුවන්නේයයි චෝදනා කරන කරුණු ක්වාසිතැන විසින් සටහන් නොකළ යුතුය.

4. (1) 2වෙනි ව්‍යවස්ථාවේ සඳහන්කර තිබුණ අන්දමට දින තිහක කාලය තුළදී ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතරේ සමාදානයක් ඇති කරලීමට නොහැකිවූ විට, පහත සඳහන් කටයුතු කිරීම ක්වාසිතැනගේ යුතුකම වන්නේය :—

(අ) පුරුෂයාගෙන් මහාරය ලබා ගැනීම සඳහා භාර්යාව විසින් ඉල්ලීමක් කර තිබෙණ විට හෝ එසේ නොමැතිව පුරුෂයා විසින් භාර්යාවට ගෙවිය යුතු මහාරය, එම නීති කෘත්‍යයෙහි පහසු යයි තමා සලකන අවස්ථාවකදී නියමිත අන්දමින් අයකර ගැනීම ;

(ආ) එසේ අයකරගත් වහාම එම මුදල භාර්යාව නමින් කච්චේරියේ තැන්පත්කොට තිබේ යයි ඇට දැනුම් දීමද වේ.

(2) මෙම ව්‍යවස්ථාවෙහි ඉහත දැක්වූ විධිවිධාන අනුව කච්චේරියෙහි තැන්පත් කරන කිසි මුදලක් ක්වාසිතැනගෙන් අවසරයක් නොමැතිව ලබාගත නොහැකිය. 1වෙනි ඡේදය යටතේ තැන්පත් කර තිබෙණ මුදල් ලබාගැනීම සඳහා ක්වාසිතැනට බලය දිය හැකි අවස්ථා දක්වා තිබෙණ නියෝග අනුව හැර යම් මුදලක් ගැනීම සඳහා ක්වාසිතැන විසින් බලය නොදිය යුතුය.

5. භාර්යාව දිවයිනෙහි නො සිටී යයි ද ඒ හේතුවෙන් 2වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන් දැන්වීම ඇ වෙත භාරකරවීම නොහැකි යයිද දිවුරුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් ක්වාසිතැනට වැටහී ගිය විට, එම දැන්වීම භාර්යාවගේ නිවටුම ඥාතිවරයා වෙත භාරකර

වන ලෙස අණකිරීමට ඔහුට පිළිවන. භායඝාවගේ කිසිදු ඥතියෙකු දිවයිනෙහි සිටින බවක් නො දන්නා විට එකී දැන්වීම භායඝාව වෙත භාරකරවීම අත්හළ හැකිය.

6. භායඝාව ක්වාසිතැන ඉදිරිපිටට පමුණුවාගත නොහැකි විටද නැතහොත් සමාදනයක් ඇතිකරවීමට නොහැකි විට ද, 2වෙනි ව්‍යවස්ථාව "තලාක්" ප්‍රකාශකිරීමේ දින සිට දින තිහක් ගත වීමෙන් පසු ක්වාසිතැන විසින් නියම කරනලද දිනයකදී පුරුෂයා ඔහු ඉදිරියට පැමිණිය යුතුය. එහිදීද ක්වාසිතැන විසින් දෙපක්ෂය අතරේ සමාදනයක් ඇතිකරලීමට උත්සාහ දැරිය යුතුය. දෙපක්ෂය අතරේ සමාදනයක් ඇති කරලීමට නො හැකිවූ විට, ස්ත්‍රිය පැමිණ නොසිටි නම් ක්වාසිතැන විසින් ඒ බව හඟවන දැන්වීමක් ඈ වෙත භාරකරවිය යුතුය.

5වෙනි ව්‍යවස්ථාවේ විධිවිධාන 2වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන් දැන්වීමක් සඳහා යම්සේ අදාළ වන්නේද, එකී විධිවිධාන මෙම ව්‍යවස්ථාව යටතේ කරනලද දැන්වීමක් සඳහා ද එලෙසම අදාළ වන්නේය.

7. 6වෙනි ව්‍යවස්ථාව යටතේ ක්වාසිතැන විසින් නියම කරනලද දින සිට දින තිහක කාලයක් ගතවීමට ප්‍රථම ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය අතර සමාදනයක් ඇතිකරලීමට නුපුළුවන්වූ විට, ක්වාසිතැන විසින් නියම කරනු ලබන, එකී කාලයට පසු දිනකදී ක්වාසිතැන ඉදිරිපිටට සවාමිපුරුෂයා පැමිණිය යුතුය. එවිට ඔහුගේ පැමිණීමද දෙපක්ෂය අතර සමාදනයක් ඇතිකරලීමට තමාට නොහැකිවීමද යන කරුණු එකෙනෙහිම සටහන් කළ යුතුය. ඊට පසු ඔහු විසින් දික්කසාදය ලියා පදිංචි කළ යුතුය.

8. 6වෙනි ව්‍යවස්ථාව හෝ 7වෙනි ව්‍යවස්ථාව යටතේ නියම කරන ලද දිනයේදී සවාමිපුරුෂයෙකු ක්වාසිතැන ඉදිරිපිට නොපැමිණි විට, 2වෙනි ව්‍යවස්ථාව යටතේ "තලාක්" ප්‍රකාශය කොට මාස තුනක කාලයක් ගතවීමෙන් පසු ඕනෑම දිනයක පුරුෂයා නොපැමිණීමට හේතුවද, දෙපක්ෂය අතරේ සමාදනයක් ඇතිකරලීමට නොහැකිවූ කරුණුද සම්බන්ධව දිවුරුම් පිට නැතහොත් සත්‍ය ප්‍රකාශයක් පිට භායඝාවගෙන් විභාග කොට ඊට පසුව දික්කසාදය ලියා පදිංචි කළ යුතුය.

9. 3වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන් අවස්ථාවලදී හැර, මෙම උප ලේඛනයෙහි ව්‍යවස්ථා යටතේ වන සියලුම නීති කෘතීන් ක්වාසිතැන විසින් සටහන් කළයුතුය.

---

## තුන්වෙනි උපලේඛනය

(28වෙනි වගන්තිය).

**ස්ත්‍රියක විසින් දික්කසාද කිරීමේදී අනුගමනය කළයුතු ව්‍යවස්ථා**

1. ස්ත්‍රියක විසින් දික්කසාදයක් සඳහා ඉල්ලීමක් කිරීමේදී මෙම පනතෙහි 67වෙනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඇය පදිංචිව සිටින ප්‍රදේශයෙහි ක්වාසිතැනට හෝ මෙම පනතෙහි 14වන වගන්තිය යටතේ එම ප්‍රදේශය සඳහා නැතහොත් එම ප්‍රදේශය ඇතුළත් ප්‍රදේශයක් සඳහා විශෙෂ ක්වාසි කෙනෙකු පත්කරනු ලැබ සිටින විට එකී විශෙෂ ක්වාසිතැනට හෝ එම ඉල්ලීම කළයුතුය.

2. එම ඉල්ලීම ලැබුණු වහාම එහි සඳහන් සියලු විස්තරද, ඒ පිළිබඳ විභාගය පැවැත්වීමට තමා විසින් නියම කරනලද දිනයද සඳහන් දැන්වීමක් ක්වාසිතැන විසින් ස්වාමිපුරුෂයා වෙත භාරකර විය යුතුය.

3. ස්වාමිපුරුෂයා දිවයිනෙහි නොසිටී යයි ද ඒ හේතුවෙන් 2වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන දැන්වීම ඔහු වෙත භාරකරවීම නොහැකියයිද දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් හෝ ක්වාසිතැනට පෙන්වා සිටි විටක එම දැන්වීම ස්වාමිපුරුෂයාගේ කිට්ටුම ඥාතිවරයා වෙත භාරකරවන ලෙස අණකිරීමට ඔහුට පිළිවන. ස්වාමිපුරුෂයාගේ කිසිදු ඥාතියෙක් දිවයිනෙහි සිටින බවක් නොදන්නා විට එකී දැන්වීම ස්වාමිපුරුෂයා වෙත භාරකරවීම අත්හල හැකිය.

4. ස්වාමිපුරුෂයා දිවයිනෙහි සිටින බවද, ඔහුට ස්ථිර වාසස්ථානයක් නොමැති බවද, ඒ හේතුවෙන් 2වෙනි ව්‍යවස්ථාවෙහි සඳහන් දැන්වීම ඔහුට භාරකළ නොහැකි බවද, දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් ක්වාසිතැනට පෙන්වා සිටි විටෙක, පුරුෂයා වෙතම දැන්වීම භාරකිරීම අත්හැර දැමීමට ඔහුට පිළිවන. එවිට ක්වාසි තැන පත්කරනුලැබ සිටින ප්‍රදේශයේ සෑම ජුම්මා පල්ලියකම ප්‍රකටව පෙනෙන ස්ථානයක ද, පදිංචි ස්ථාන දන්නා කිට්ටුවම ඥාතීන්ගේ ගෙවල්වලද එකී දැන්වීමේ පිටපතක් අලවා තැබීමට නියමකළ හැකිය.

5. මෙම ව්‍යවස්ථා අනුව පුරුෂයාට දැන්වීම භාරකරවීමට යොදන ලද සියලු උපක්‍රම ක්වාසිතැන විසින් ලියා තැබිය යුතුය.

6. ඉල්ලීම පිළිබඳ විභාගය පැවැත්වීමට නියමකරනලද දිනයේදී ස්වාමිපුරුෂයා නොපැමිණියහොත් දැන්වීම භාරකරවීම නැතහොත් දැන්වීම අලවා තැබීම දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් හෝ ඔප්පුකළ යුතුය. 3වෙනි ව්‍යවස්ථාව යටතේ දැන්වීමක් භාර කිරීම ක්වාසිතැන විසින් අත්හැර තිබෙණ විටෙක මෙය අනවශ්‍යය.

7. ඊට පසුව මෙම පනත යටතේ සාදනලද නියෝගවල අඳුමට, එකී ඉල්ලීම පිළිබඳ විභාගයේදී තමාට සහායවනු පිණිස මෙම උප ලේඛනයේ මින්මතු " මුස්ලිම් උපදේශකවරු " යන්නෙන් අදුන්වන මුස්ලිම් උපදේශකවරු තිදෙනෙකු පත්කළ යුතුය.

එසේවූවද, මෙහි පහත සඳහන්කරනුලබන අවස්ථාවලදී පමණක් මුස්ලිම් උපදේශකවරුන් පත්කිරීම අනවශ්‍යය. එනම්:—

(අ) ඉල්ලීම ගැන විභාගය පවත්වන ක්වාසිතැන මෙම පනතෙහි 14වෙනි වගන්තිය යටතේ පත්කරනලද විශෙෂ ක්වාසි කෙනෙකු වීම ; නැතහොත්

(ආ) එබඳු ඉල්ලීමක් ගැන විභාගයක් පවත්වන ප්‍රදේශයේ ඉතා ස්වල්ප මුස්ලිම් ජනගහනයක් ඇති නිසා හෝ අන්කිසි කාරුණක් නිසා හෝ මුස්ලිම් උපදේශකවරුන්ගේ සහාය නොමැතිව දික්කසාදය පිළිබඳ ඉල්ලීම විභාග කළ හැකි යයි ගැසට්පත්‍රයේ දැන්වීමක් පළකරවීමෙන් අමාත්‍යවරයා විසින් නියම කිරීමද වේ

8. ගම්සභා පනත යටතට ගෙනෙනලද ප්‍රදේශයක මුස්ලිම් උප දේශකවරුන් වියයුත්තෝ ඒ ප්‍රදේශයෙහි පදිංචිව සිටින, ගම්සභාවක සභිකත්වය සඳහා එම පනත යටතේ තිබියයුතු සුදුසුකම් ඇති, මුස්ලිම් පුරුෂයෝය. මුස්ලිම් උපදේශකවරුන් මෙන් කටයුතු කිරීමේ සේවයෙන් විවාහ මරණ ලේකම්වරු මෙයින් නිදහස්කරනු ලැබෙති.

9. ගම්සභා පනත යටතේ නොමැති ප්‍රදේශයක මුස්ලිම් උප දේශකයන් වියයුත්තෝ එම ප්‍රදේශය වෙනුවෙන් පිළියෙළකරන ලද සභික නාමලේඛනයෙහි නම් දැක්වෙන, එහිම පදිංචිව සිටින මුස්ලිම් පුරුෂයෝය.

10. දික්කසාදවීම සඳහා කරනු ලබන ඉල්ලීමක් විභාගකිරීමට ප්‍රථම, නිත්‍යානුකූලවූ සෑම අන්දමකින්ම දෙපක්ෂය සමාදාන කිරීමට උත්සාහ කිරීමද, දෙපක්ෂයේම කැමැත්ත ඇතිව ඔවුනතර පැවති අවහිරයට නියම හේතුව නැවැත්වීම හෝ ඉවත්කිරීම ද ඊට පසුව එවැන්නක් සිදුවීම වැළැක්වීම ද සෑම ක්වාසිකෙනෙකුගේ සහ මුස්ලිම් උපදේශකවරුන් ඇතිවූ විටෙකදී ඔවුන්ගේද යුතුකම වන්නේය. එහෙත් එබඳු සමාදානයකට දෙපක්ෂය එකඟ නොවන විට, ක්වාසිතැනද, මුස්ලිම් උපදේශකවරු ඇතිවූ විට ඔවුන්ද සාක්ෂි අසා ඉල්ලීම පිළිබඳව තීරණයක් කළ යුතුය.

11. ක්වාසිතැන විසින් එබඳු දික්කසාද විභාගයක වූ නිතිකෘත්‍ය යන් සඳහා නඩුපොතක් තැබිය යුතුය. භායඞාව සහ ඇගේ සාක්ෂි කාරයන් විසින්ද, ස්වාමිපුරුෂයා පැමිණ සිටි නම් ඔහු සහ ඔහුගේ සාක්ෂිකාරයන් විසින්ද, කරනලද දිව්රුම් හෝ සත්‍ය ප්‍රකාශයන් එහි ඇතුළත්කළ යුතුය. කොයියම් අවස්ථාවකදී වුවද භායඞාවගේ පක්ෂයෙන් විභාගකරනලද සාක්ෂිකරුවන්ගේ ගණන දෙදෙනෙකුට අඩුනොවිය යුතුය. එබඳු සියලුම සාක්ෂි එය කරනලද තැනැත්තාට ක්වාසිතැන විසින් කියවා එහි වැරදි, නිවැරදි කිරීමෙන් පසු කලින් කී තැනැත්තාගෙන් එයට අත්සන් ගත යුතුය. එබඳු සටහනක් ඉහතකී තැනැත්තා විසින් අත්සන්කරන්ට බැරියයි කී කල්හි ඒ කරුණද ක්වාසිතැන විසින් සටහන්කළ යුතුය.

12. තීරණය සඳහා පැනනැගෙන කරුණු පිළිබඳව මුස්ලිම් උප දේශකයන් විසින් පළමුකොට ඔවුන්ගේ අදහස ප්‍රකාශකිරීමෙන් පසුව ක්වාසිතැන තමන්ගේ අදහස ප්‍රකාශකළ යුතුය. මුස්ලිම් ක්වාසි සහ මුස්ලිම් උපදේශකයන් අතර හෝ ඔවුන්ගෙන් එක් කෙනෙකු අතර හෝ මතභේදයක් ඇතිවූවිට හෝ නැතහොත් මුස්ලිම් උපදේශකයන්ගෙන් එක්කෙනෙකුට වැඩි ගණනක් තමන්ගේ අදහස ප්‍රකාශ කිරීමට බැරියයි කියනලද කල්හි ක්වාසි තැනගේ අදහස පිළිගත යුතුය. ඔහුගේ එම අදහස අනුව පාර්ශවකාරයන් අයත් නිකාය පාලනයකරන මුස්ලිම් නීතිය යටතේ සුදුසුයයි හැඟෙන තීරණයක් එම ඉල්ලීම පිළිබඳව ඔහු විසින් කළ යුතුය. උපදේශකවරුන් හා තමන් අතරේ ඇතිවුණු සෑම මත භේදයක් හෝ යම්කිසි උපදේශකයෙකු විසින් තම අදහස ප්‍රකාශ කිරීමට බැරියයි කීමක් හෝ නඩු පොතෙහි සටහන් කළ යුතුය.

13. දික්කසාදය පිළිබඳ ඉල්ලීම ගැන තීරණයක් කළ වහාම ක්වාසිතැන විසින් එය නඩු පොතෙහි ලියා තැබිය යුතුය. ක්වාසි

ලද ප්‍රදේශයක මුස්ලිම් උප
හි පදිංචිව සිටින, ගම්සභාවක
 තිබියයුතු සුදුසුකම් ඇති,
ශකවරුන් මෙන් කටයුතු
ම්වරු මෙයින් නිදහස්කරනු

ති ප්‍රදේශයක මුස්ලිම් උප
 වෙනුවෙන් පිළියෙළකරන
වෙන, එහිම පදිංචිව සිටින

න ඉල්ලීමක් විභාගකිරීමට
 දෙපක්‍ෂය සමාදාන කිරීමට
ත ඇතිව ඔවුනතර පැවති
හෝ ඉවත්කිරීම ද ඊට පසුව
ම ක්වාසිකෙනෙකුගේ සහ
ටකදී ඔවුන්ගේද යුතුකම
ට දෙපක්‍ෂය එකඟ නොවන
රු ඇතිවූ විට ඔවුන්ද සාක්‍ෂි
යුතුය.

සාද විභාගයක වූ නීතිඥානය
 හායසීව සහ ඇගේ සාක්‍ෂි
 සිටී නම් ඔහු සහ ඔහුගේ
ම හෝ සත්‍ය ප්‍රකාශයන් එහි
ථාවකදී වුවද හායසීවගේ
න්ගේ ගණන දෙදෙනෙකුට
 එය කරනලද තැනැත්තාට
වැරදි කිරීමෙන් පසු කලින්
ත යුතුය. එබඳු සටහනක්
රන්ට බැරියයි කී කල්හි ඒ
ළ යුතුය.

රුණු පිළිබඳව මුස්ලිම් උප
ගේ අදහස ප්‍රකාශකිරීමෙන්
ප්‍රකාශකළ යුතුය. මුස්ලිම්
තර හෝ ඔවුන්ගෙන් එක්
ඇතිවූවිට හෝ නැතහොත්
කෙනෙකුට වැඩි ගණනක්
යි කියනලද කල්හි ක්වාසි
ඔහුගේ එම අදහස අනුව
කරන මුස්ලිම් නීතිය යටතේ
ම පිළිබඳව ඔහු විසින් කළ
අතරේ ඇතිවුණු සෑම මත
 විසින්, තම අදහස ප්‍රකාශ
ගි සටහන් කළ යුතුය.

ත තීරණයක් කළ වහාම
ලියා තැබිය යුතුය. ක්වාසි

විසින්ද, මුස්ලිම් උපදෙශකයන් විසින්ද, හායසීව විසින්ද, පුරුෂයා පැමිණ සිටී නම් ඔහු විසින්ද එම නඩු පොතෙහි අත්සන් කළ යුතුය.

14. එම දික්කසාද ඉල්ලීමට සම්බන්ධවූ දෙපාර්ශවයෙන් කොයියම් පාර්ශවයකට වුවද, නියමිත ගාස්තුව ගෙවූ විට, ක්වාසිතැන විසින් නඩු පොතෙන් සහතික පිටපතක් සැපයිය යුතුය.

15. දික්කසාදයකට ඉඩහරිමින් ක්වාසිකෙනෙකු විසින් කරනලද තීරණයකට විරුඬව ඇපැල් ගතයුතු කාලසීමාව පසුවීනම් හෝ ක්වාසි මණ්ඩලයට ඇපැල්ගෙන තිබී, එම මණ්ඩලය දික්කසාදය කිරීමට ඉඩහැරීමෙන් පසු හෝ ශ්‍රෙෂ්ඨාධිකරණයට තවත් දුරට ඇපැල් ගෙන තිබී එම අධිකරණය දික්කසාදයට ඉඩහරිනලදනම් එම දික්කසාදය ලියා පදිංචි කිරීම ක්වාසිතැනගේ යුතුකම වන්නේය.

---

## හතරවෙනි උපලේඛනය

**47වෙනි වගන්තිය යටතේ පැවැත්වෙන විභාගයක් පිළිබඳ ව්‍යවස්ථා**

1. 47 වෙනි වගන්තියෙහි සඳහන් සෑම ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් එම ඉල්ලුම්කාරයා හෝ පැමිණිලිකාරයා පදිංචිව සිටින ප්‍රදේශයෙහි ක්වාසිතැන වෙත හෝ විශෙෂ ක්වාසිකෙනෙකු පත්කොට තිබේ නම් ඔහු වෙත හෝ ඉදිරිපත්කළ යුතුය. මින්මතු වගඋත්තරකාරයා යයි කියනු ලබන, තමන් සහනය බලාපොරොත්තු වන හෝ තමන් විරුඬව ක්‍රියාකරන පාර්ශවකාරයා හෝ එක් එක් පාර්ශවකාරයා එහි සඳහන් කළ යුතුය.

2. ඉල්ලීමක් හෝ පැමිණිල්ලක් ලැබුණු වහාම එය විභාග කිරීම සඳහා දිනයක් නියමකළ යුතුය. තවද එම ඉල්ලීම හෝ පැමිණිල්ල පිළිබඳ දැන්වීමක්ද, එසේ නියමකරනලද දිනය ගැන දැන්වීමක්ද වගඋත්තරකාරයා වෙත භාරකළ යුතුය.

එසේවුවද, එබඳු වගඋත්තරකාරයෙක් දිවයිනෙහි නොමැති බව හෝ ඔහුට සථිර පදිංචියක් නැති බව හෝ දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් හෝ ක්වාසිතැනට පෙන්වා සිටි විට, තුන්වෙනි උපලේඛනයේ 3වෙනි හෝ 4වෙනි ව්‍යවස්ථාවේ විධිවිධාන, අවස්ථානුකූලව අදාළ කළහැකි ප්‍රමාණයට අදාළවිය යුතුය.

3. විභාගයට නියමිත දිනයෙහි වගඋත්තරකාරයා පැමිණ සිටිනම් ක්වාසිතැන විසින් විභාගය පැවැත්විය යුතුය. තවද දෙපක්‍ෂයේම සාක්‍ෂි විභාගකිරීමෙන් පසුව ඉල්ලීම හෝ පැමිණිල්ල පිළිබඳව තමන්ට සාධාරණයයි හැඟෙන තීරණයක් කළ යුතුය.

4. විභාගයට නියමිත දිනයෙහි වගඋත්තරකාරයා පැමිණ නොසිටියේනම්, වගඋත්තරකාරයාට දැන්වීම භාරකිරීම නුවුවමනා බව ක්වාසිතැන විසින් නියමකොට තිබේනම් නැතහොත් දැන්වීම අලවා තිබූ බව දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් ඔප්පුවෙයි නම්, එම විභාගය ක්වාසිතැන විසින් තනිපිට පැවැත්විය යුතුය.

ඉක්බිතිව, ඉල්ලුම්කාරයා හෝ පැමිණිලිකාරයා හෝ ඉල්ලනලද සහනය දීම සුදුසු බව ක්වාසිතැනට ඒත්තුගියේනම්, ආඥාවෙහි නියමිත දිනයකදී එයට විරුඬව කරුණු වගඋත්තරකාරයා විසින් නොපෙන්වනු ලැබුවහොත් පමණක් ස්ථිරවන පරිදි ඉල්ලුම් කාරයාගේ හෝ පැමිණිලිකාරයාගේ වාසියට නයිසයි ආඥාවක් කළ යුතුය. තවද එම ආඥාවෙහි පිටපතක් ඔහුගේ අත්සනින් සහතික කොට වගඋත්තරකාරයා වෙත භාරකරවීමට ද නියමකළ යුතුය.

එසේවුවද, එබඳු වගඋත්තරකාරයෙකු දිවයිනෙහි නොමැති බව හෝ ඔහුට ස්ථිර පදිංචියක් නොමැති බව හෝ දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් ක්වාසිතැනට පෙන්වා සිටි විට, තුන්වෙනි උපලෙඛනයේ 3වෙනි හෝ 4වෙනි ව්‍යවස්ථාවේ විධිවිධාන අවස්ථානුකූලව අදාළ කළහැකි ප්‍රමාණයට වන්නේය.

5. වගඋත්තරකාරයා වෙත නයිසයි ආඥාවෙහි පිටපතක් භාරකරවීම නුවුවමනා යයි ක්වාසිතැන විසින් නියමකරනලද විටක හෝ එබඳු පිටපතක් භාරකරවීම නැතහොත් එබඳු පිටපතක් අලවා තැබීම, දිව්රුම් ප්‍රකාශයකින් හෝ සත්‍ය ප්‍රකාශයකින් හෝ ඔප්පුවූ විටක හෝ වගඋත්තරකරයා නොපැමිණි අවස්ථාවක හෝ වගඋත්තරකාරයා පැමිණසිටි නමුත් එම ආඥාවට විරුඬ කරුණු පෙන්වීමට නොහැකිවූ අවස්ථාවක හෝ ක්වාසිතැන විසින් එම නයිසයි ආඥාව නියත ආඥාවක් කළ යුතුය.

6. වගඋත්තරකාරයා පැමිණ, නයිසයි ආඥාව නියත ආඥාවක් නොකළයුතු බවට ක්වාසිතැනට ඒත්තු වන සේ කරුණු පෙන්වා සිටි කල්හි, ක්වාසිතැන විසින් නයිසයි ආඥාව අවලංගුකොට, 2වෙනි ව්‍යවස්ථාව යටතේ නිකුත්කරනලද දැන්වීම අනුව වගඋත්තරකාරයා නොපැමිණීමෙන් වරදක් නුවූ සේ විභාගය පැවැත්විය යුතුය.

7. නීති කෘත්‍ය සටහන් කිරීම පිළිබඳව තුන්වෙනි උපලේඛනයේ 11වෙනි ව්‍යවස්ථාවෙහි විධිවිධාන, මෙම උපලේඛනයෙහි ව්‍යවස්ථාවන් යටතේ පවත්වනුලබන විභාගවලටද හැකිතරම් දුරට අදාළ වන්නේය.

8. මෙම උපලෙඛනයෙහි ව්‍යවස්ථා යටතේ පවත්වනලද විභාගයකදී ක්වාසිකෙනෙකු විසින් කරනලද සෑම ආඥාවක්ම නඩු පොතෙහි ලියා තැබිය යුතුය. එම නඩු පොතෙහි ක්වාසි විසින්ද ඉල්ලුම්කාරයා හෝ පැමිණිලිකාරයා විසින්ද වගඋත්තර කාරයා පැමිණ සිටි නම් ඔහු විසින්ද අත්සන්කළ යුතුය.

9. එම විභාගයට සම්බන්ධවූ දෙපාර්ශවයෙන් කවර පාර්ශවයකටවුව, නියමිත ගාස්තුව ගෙවූ විට, ක්වාසිතැන විසින් නඩු පොතෙන් සහතික පිටපතක් සැපයිය යුතුය.

10. මෙම උපලෙඛනයෙහි ව්‍යවස්ථා අනුව ක්වාසිකෙනෙකු විසින් කරනලද නියත ආඥාවකට විරුඬව ඇපැල් ගත නොහැකිය. එහෙත් යම් කෙනෙකුට නියත ආඥාවක් කරනලදුව, ඔහු එබඳු ආඥාවක් කිරීමෙන් පසු සැහෙන කාලයක් ඇතුළතදී පැමිණ, තමන්ට

එම ආඥාව නියත ආඥාවක් කිරීමට විරුඬව කරුණු දැක්වීමට පැමිණීමට නොහැකිවූයේ අසනීපයක් නිසා යයි ද නැතහොත් හදිසි අනතුරක් නිසායයිද නැතහොත් අවාසනාවන්ත සිඬියක් හෝ නොවැළැක්වියහැකි කරුණක් නිසායයිද නැතහොත් එම විභාගයේ දැන්වීමක් නොලැබූ නිසායයිද ක්වාසිතැනට ඒත්තුයන ලෙස ඔප්පු කළොත්, තමන්ට සාධාරණයැයිද සුදුසුයයිද හැඟෙන නියම පිට එම නියත ආඥාව අවලංගුකොට එම නොපැමිණීමෙන් වරදක් නුවූ ලෙස විභාගය පැවැත්වීමට ක්වාසිතැනට පිළිවන.

---

## පස්වෙනි උපලේඛනය

### ඇපැල් ගැනීම පිළිබඳ ව්‍යවස්ථා

1. ක්වාසිකෙනෙකු විසින් කරනලද තීරණයකට විරුඬව ඇපැල් ගැනීමේ බලයක් මෙම පනතෙහි යම්කිසි විධානයකින් යම්කිසි පාර්ශවයකට පවරනලද කල්හි එබඳු ඇපැලක් පහත දැක්වෙන කාලසීමා ඇතුළත ක්වාසි මණ්ඩලයට ලිපි මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(අ) 47වෙනි වගන්තියේ 2වෙනි උපවගන්තිය යටතේ කරන ලද තීරණයකට විරුඬනම් එම තීරණය කළ දින සිට දින දහයක් ඇතුළතදීද ;

(ආ) වෙනත් අන්කිසි තීරණයකට විරුඬවනම් එම තීරණය කළ දින සිට දින තිහක් ඇතුළතදීද වේ.

එසේවුවත්, එම කාලය ගතවීමෙන් පසු ඇපැලක් භාරගැනීමට ක්වාසි මණ්ඩලයට පැවරී ඇති බලයට මෙම ව්‍යවස්ථාවෙහි ඉහත කී විධිවිධානවලින් අවහිරයක් නොවන්නේය.

2. ප්‍රසිඬියේ හෝ අප්‍රසිඬියේ හෝ ඇපැලක් විභාග කිරීමට ක්වාසි මණ්ඩලයට පිළිවන. තවද එම විභාගය නියම ලෙස පැවැත්වීම, සඳහා අවශ්‍යයයි එම මණ්ඩලයට හැඟෙන අවස්ථාවලදී ඇපැලෙහි දෙපාර්ශවයෙන් කවර පාර්ශවයක් විසින් නමුදු ඉදිරිපත්කරනු ලබන නවත් සාක්ෂිද ඇසීමට මණ්ඩලයට පිළිවන.

3. (1) ක්වාසි මණ්ඩලය විසින් කරනලද සෑම තීරණයක්ම ලියා තැබිය යුතුවත් හැර එම සටහනෙහි ඇපැල විභාග කිරීමේදී පැමිණ සිටි සියලුම සාමාජිකයන් ලවා අත්සන් කිරීමද කළ යුතුය.

(2) ක්වාසි මණ්ඩලය විසින් කරනලද සියලු තීරණ ඇපැල්කරුටද, වගඋත්තරකරුටද දැන්විය යුතුය.

4. ක්වාසි මණ්ඩලය විසින් කරනලද තීරණයකට විරුඬවන පාර්ශවකාරයෙකුට, එම තීරණය පිළිබඳ ඉහතකී ලෙස දැන්වීම ලැබී තිස් දිනක් ඇතුළතදී, එම තීරණයට විරුඬව ඇපැල් ගැනීමට අවසර ඉල්ලා පෙත්සමක මාර්ගයෙන් ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් ඉල්ලුම් කළ හැකිය. එබඳු ඉල්ලීමක් කළ බව ඇපැලෙහි අනිත් පාර්ශවකාරයාට කලින් කී අය විසින් දැනුම්දිය යුතුයි.

5. ක්වාසි මණ්ඩලයේ තීරණයකට විරුඬව ඇපැල් ගැ
අවසර නොදීමේදී, ගාස්තු පිළිබඳව ශ්‍රෙෂ්ඨාධිකරණයට සාධාරණ
නැගෙන නියමයක්ද කළ හැකිය.

6. ක්වාසි මණ්ඩලයේ තීරණයකට විරුඬව ඇපැල් ගැ
අවසර දීමේදී, ඉදිරිපත් කිරීමට අදහස්කරන ඇපැල වයඹවූ
ගෙවියයුතු ගාස්තු ගෙවීම පිළිබඳව යෝග්‍යයයි කල්පනාකර
අනුමේ නියම පැනවීමටද ශ්‍රෙෂ්ඨාධිකරණයට පිළිවන.

7. ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් ඇපැලක් විභාග කළ විට, න
විභාගයක් පැවැත්වීමට හෝ වෙනත් සාක්ෂි ඇසීමට හෝ ක්
නැනට නියම කිරීමද නැතහොත් ක්වාසිකෙනෙකු විසින්
ක්වාසි මණ්ඩලය විසින් හෝ කරනලද තීරණය ස්ථිර කිරීමට
වෙනස් කිරීමට හෝ සංශොධනය කිරීමට හෝ නියම කි
නීත්‍යනුකූල වන්නේය.

8. යම්කිසි නීති කෘත්‍යයක් පිළිබඳව ක්වාසිකෙනෙකු වි
නිර්ණයක් කරනු ලදුව එයට විරුඬව ක්වාසි මණ්ඩලයට
ශ්‍රෙෂ්ඨාධිකරණයට ඇපැල් ගත්විට.—

(අ) ඇපැල්කරු විසින් ක්වාසිතැනට එම ඇපැල ගැන දැනුම්
යුතුය.

(ආ) තවද ක්වාසි මණ්ඩලය හෝ ශ්‍රෙෂ්ඨාධිකරණය විසින්
නඩුව පිළිබඳ ඇපැලේදී කරනලද තීරණය ක්වාසි
විසින් ක්‍රියාවෙහි යෙදවිය යුතුය.